# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2350/24 – 2023 සැප්තැම්බර් මස 19 වැනි අඟහරුවාදා – 2023.09.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 179 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/15/2014/VE/63.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 04/03/01/13II.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අගෝස්තු මස 31 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි**.- ප්‍රාදේශීය ලේකම්, මදුරාවල

II. **ඉඩමේ විස්තරය**.– බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක.633 ඒ- කනන්විල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ,වේරවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක. 4692 හා 2019.06.07 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක '01' - නාගහකන්ද වත්ත - ප්‍රමාණයඃ හෙක්. 5.1761**

උතුරටඃ ඇළ, ඉඩමේ නම සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි කුඹුර, ඩී.වයි. එදිරිමාන්න හිමිකම් කියන වනාතෙ වත්ත, ඩී.වයි. එදිරිමාන්න හිමිකම් කියන නාගහකන්ද වත්ත, ඩී.වයි. එදිරිමාන්න හිමිකම් කියන වනාතෙ වත්ත සහ හොරණ වැවිලි සමාගම හිමිකම් කියන නාගහකන්ද වත්ත; නැගෙනහිරටඃඩී.වයි. එදිරිමාන්න හිමිකම් කියන වනාතෙ වත්ත,ඩී.වයි. එදිරිමාන්න හිමිකම් කියන නාගහකන්ද වත්ත,ඩී.වයි. එදිරිමාන්න හිමිකම් කියන නාගහකන්ද, ඩී.වයි. එදිරිමාන්න හිමිකම් කියන වනාතෙ වත්ත, හොරණ වැවිලි සමාගම හිමිකම් කියන නාගහකන්ද වත්ත, කරුණාරත්න ජයවීර හිමිකම් කියන නාගහකන්ද වත්ත.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කරුණාරත්න ජයවීර හිමිකම් කියන රත්නගොඩ වත්ත සහ පාර; දකුණට: කේ. ඇසිලින් නෝනා හිමිකම් කියන නාගහකන්ද වත්ත,කේ. ඇසිලින් නෝනා හිමිකම් කියන පිටරුකත්තෙ වත්ත, සමන්ත දේවප්‍රිය සහ තවත් අය හිමිකම් කියන නාගහකන්ද වත්ත සහ ඇළ; බටහිරට:සමන්ත දේවප්‍රිය සහ තවත් අය හිමිකම් කියන නාගහකන්ද වත්ත සහ ඇළ .

EOG 09-0185

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 180 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2014/RPR/428.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/3/2/95.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අගෝස්තු මස 31 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.-** ප්‍රාදේශීය ලේකම්, හෝමාගම

II. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරළේ සුළු කොට්ඨාසයේ, පානළුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/HMG/2015/596 හා 2015.12.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අංක '01' - අත්තනපොලවත්ත - ප්‍රමාණයඃ හෙක්. 13.4832

උතුරටඃ හිමිකම් කියන්නා සොයාගත නොහැකි, කොට්ටනේලන්ද ඇළ සහ පාර; නැගෙනහිරට: පාර, මාර්ගය විතානගේ ලීලාවතී හිමිකම් කියන අත්තනපොලලන්ද, සීමන්සිංඤෝ හිමිකම් කියන අත්තනපොලලන්ද, කේ. ආනන්ද හිමිකම් කියන අත්තනපොලලන්ද, පාර, දිපිකා කුමාරගේ හිමිකම් කියන අත්තනපොලලන්ද සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොට්ටනේලන්ද; දකුණට: මාර්ගය විතානගේ ලීලාවතී හිමිකම් කියන අත්තනපොලලන්ද, සීමන් සිංඤෝ හිමිකම් කියන අත්තනපොලලන්ද,කේ. ආනන්ද හිමිකම් කියන අත්තනපොලලන්ද, පාර, දිපිකා කුමාරගේ හිමිකම් කියන අත්තනපොලලන්ද සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි කොට්ටනේලන්ද; බටහිරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි, කොට්ටනේලන්ද සහ ඇළ .

EOG 09-0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.